පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.02 පැය 1700 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/624 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ඉන්දීය අග්‍රමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරයේ රථවාහන සැලැස්ම සම්බන්ධව**

ඉන්දීය අග්‍රමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය අප්‍රේල් මස 04 වන දින ආරම්භ වීමට නියමිතය. ඒ අනුව මෙම සංචාරය වෙනුවෙන් විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව 2025.04.04 වන දින සවස 06.00 සිට රාත්‍රී 10.00 දක්වා කොළඹ කටුනායක අධිවේගී මාර්ගය හා බේස්ලයින් මාර්ගය අවස්ථා කිහිපයකදී වසා තැබීමට කටයුතු කරනු ලබයි.

එමෙන්ම මෙම කාලසීමාව තුළ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල වෙත පැමිණෙන තැනැත්තන්ට මෙම මාගර් වසා තැබීම පිළිබඳ අවධානය යොමු කරමින් තමන්ගේ සංචාරය සැලසුම් කරගන්නා ලෙසට වැඩිදුරටත් දන්වා සිටි.

2025.04.05 වන දින ගාල මුවදොර, නිදහස් චතුරස්‍රය සහ බත්තරමුල්ල අපේගම පරිශ්‍රය යන ප්‍රදේශයෙන්හි මාගර් අවස්ථා කිහිපයකදී වසා තැබීමට කටයුතු කරනු ලබයි. මෙම කාලසීමාව තුළදි රථවාහන තදබදය හා රියදුරන්ට සිදුවන අපහසුතාවය අවම කර ගැනීම සඳහා රියදුරන් විකල්ප මාගර් වෙත යොමු කිරීමට රථවාහන නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත.

ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය වෙනුවෙන් ශ්‍රී ලංකා පොලිසිය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම විශේෂ රථ වාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස පොලිසිය රියදුරන් ඇතුළු මහජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**